# බළන්ගොඩ නගර සභාව

# බළන්ගොඩ තානායම සඳහා ලංසු ආරාධනයයි.

2016 සැප්තැම්බර් මස 15 වන දින සිට 2021 සැප්තැම්බර් මස 14 වන දින දක්වා වසර 05 (පහ)ක කාලයකට බදු දීම සඳහා පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන බළන්ගොඩ නගරසභා තානායම වෙනුවෙන් මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් එම්.එච්.සීලවතී වන මා විසින් 2016 සැප්තැම්බර් මස 07 (හත්) වන දින පෙ.ව. 10.00 (දහය) දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර කාර්යාලයීය දුරකථන අංක 045-2287275 කාර්යාල වේලාවේ දී ඇමතීමෙන් හෝ urbanbg@ sltnet.lk වෙතින් ලබාගත හැකි ය.

**තානායම් පරිශ්‍රය පරීක්ෂා කිරීමට ඇති හැකියාව:**

ටෙන්ඩර් අයදුම් අපේක්ෂිතයෙක් හට 2016 අගෝස්තු මස 16 (දහසය) වන දින සිට 2016 සැප්තැම්බර් මස 05 (පහ) වන දින දක්වා සතියේ දිනවල පෙ.ව. 09.00 (නවය) සිට ප.ව. 04.00 (හතර) දක්වා බළන්ගොඩ නගර සභා තානායම හා පරිශ්‍රය නගර සභාවේ ලේකම්ගේ අනුමැතිය සහිතව පරීක්ෂාකළ හැකි ය.

**ලංසුපත් නිකුත් කිරීම:**

2016 සැප්තැම්බර් මස 06 (හය) වන දින ප.ව. 03.00 (තුන) දක්වා ලංසුපත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී නිකුත් කරනු ලැබේ.

**ලංසුපත් භාර ගැනීම:**

2016 සැප්තැම්බර් මස 07 (හත) වන දින පෙ.ව. 10.00 (දහය) දක්වා ලංසුපත් භාරගනු ලැබේ. සම්පූර්ණ කරන ලද ඔබගේ ලංසු අයදුම්පත් "ලේකම්, බළන්ගොඩ නගර සභාව" යන ලිපිනයට ලේඛනගත තැපැලෙන් යොමු කිරීමෙන් හෝ කාර්යාලයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනැවිත් බහාලීමෙන් හෝ ඉදිරිපත් කළ හැකි ය.

**ලංසුපත් විවෘත කිරීම:**

2016 සැප්තැම්බර් මස 07 (හත) වන දින පෙ.ව. 10.30 (දහයයි තිහ) ට ටෙන්ඩර් පෙට්ටිය බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. ලංසුපත් විවෘත කිරීමේ අවස්ථාවට ලංසු අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැකි ය.

**විශේෂ කොන්දේසි:**

ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ "බළන්ගොඩ නගර සභා තානායම සඳහා ටෙන්ඩර්ය" ලෙස සඳහන් කළ යුතුය.

### උප ලේඛනය

| අනු අංකය | ලංසුපත් කැඳවනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය | බදු කාලය | ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල | ආපසු ගෙවනු නොලබන ලංසු අයදුම්පත් ගාස්තු | | | | අවම මාසික ලංසු මුදල |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | ගාස්තුව | වැට් | ජා.ගො.බ | එකතුව | |
| 01 | බළන්ගොඩ නගරසභා තානායම | අවුරුදු 05 කි | රු.25,000/= | රු.5,000/= | රු.561/= | රු.102/= | රු.5,663/= | රු. 250,000/= |

පිළිගත් අවම ලංසුවට අමතරව රජය විසින් කලින් කලට පනවන බදු මුදල් ද ගෙවිය යුතුය.

තෝරා ගන්නා ලද බදු කරුවන්ගෙන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බළන්ගොඩ නගර සභාවට ගෙවිය හැකි ය. එම මුදලින් තුනෙන් එකක කොටසක් ලංසු අයදුම්කරු තෝරා ගෙන පළමු පැය තුළ තැන්පත් කළ යුතු ය. ඉතිරිය එක වර තැන්පත් කර 2016 සැප්තැම්බර් මස 15 (පහළව) දින වන විට හෝ ඊට ප්‍රථම මෙම සභාව සමඟ ගිවිසුම් අත්සන් කළ යුතු ය.

ලංසු පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අවසාන තීරණය බළන්ගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතු ය.

2016 අගොස්තු මස 12 වන දින,
බළන්ගොඩ නගරසභාවේ දීය.

එම්.එච්.සීලවතී,
ලේකම් /විශේෂ කොමසාරිස්
බළන්ගොඩ නගර සභාව